පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.03 පැය 1535 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/633 / 2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


## ශ්‍රී ලංකා පොලිසිය හා ජාතික අපනයන සංවර්ධන මණ්ඩලය අතර ද්වීපාශර්වීය අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම - පොලිස් මූලස්ථානය

ශ්‍රී ලංකා පොලිසිය සිදු කරගෙන යනු ලබන විමශර්න කායර්යන් කඩිනමින් කර ගැනීමේ අරමුණින් ඒ සඳහා සක්‍රීය ලෙස සම්බන්ධ කර ගත හැකි ආයතන හඳුනාගෙන ඒ ආයතන සමඟ අන්නෝන්‍ය සහයෝගීතාවය ලබා ගැනීමේ එක් පියවරක් ලෙස 2025 අප්‍රේල් මස 03 වන අද දින පොලිස් මූලස්ථානයේ දී පහත සඳහන් ආයතන සමඟ අවබෝධතා ගිවිසුම් ඇති කර ගැනීම සිදු කෙරිණි.

ඒ අනුව මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම සම්බන්ධයෙන් සිදුකරනු ලබන විමශර්න සඳහා අන්නෝන්‍ය සහයෝගීතාවය ලබා ගැනීමට ජාතික අපනයන සංවර්ධන මණ්ඩලය, මැණික් හා ස්වණර්ාභරන අධිකාරිය, රජයේ තක්සේරු දෙපාතර්මේන්තුව හා ජාතික සැලසුම් මධ්‍යස්ථානය යන ආයතන හා ශ්‍රී ලංකා පොලිසිය අතර ද්වීපාශරීක අවබෝධතා ගිවිසුම් නිල වශයෙන් අත්සන් කිරීම සිදු කරන ලදී.

මේ සඳහා ශ්‍රී ලංකා පොලිසිය වෙනුවෙන් වැඩබලන පොලිස්පති නීතිඥ ප්‍රියන්ත වීරසූරිය මහතා ද ජාතික අපනයන සංවර්ධන මණ්ඩලය නියෝජනය කරමින් එහි සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී මංගල විජේසිංහ මහතා, රජයේ තක්සේරු දෙපාතර්මේන්තුව නියෝජනය කරමින් රජයේ ප්‍රධාන තක්සේරු නිලධාරී ඒ.එස්.ඩබ්.කේ.නානායක්කාර මහතා, මැණික් හා ස්වණර්ාභරණ අධිකාරිය නියෝජනය කරමින් එහි සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී ඇන්තනී නවීන්ද්‍ර මහතා, ජාතික සැලසුම් මධ්‍යස්ථානය නියෝජනය කරමින් එහි සභාපති සිසිර අමරබන්දු මහතා මෙම අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම සඳහා එක්වන ලදි.

මෙම අවස්ථාව සඳහා අපරාධ පරීක්ෂණ දෙපාතර්මේන්තුවේ අධ්‍යක්ෂ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ඉමේෂා මුතුමාල මහත්මිය, නීති කොට්ඨාසයේ අධ්‍යක්ෂ ඩී.එම්.එන්.සී. සෝමසිංහ මහතා ද සහභාගී වන ලදී.




SRI LANKA POLICE






NKA POLICE


SRI LANKA POLICE










පොලිස් මාධ්‍ය කොට්ඨාසය.